†1 .

කිරි සුදු හාවා – පැන පැන ආවා
එළවළු කොටුවේ – දළුකොළ කෑවා
දැක මගෙ පඹයා – බිය වී වෙව්ලා
වැටට උඩින් උෟ – පැන පැන දිව්වා

†2 .

මේ ගසේ බොහෝ – පැණි දොඩම් තිබේ
පැහිල ඉදිල බිමට නැමිල – බර වෙලා අතු
නංගිටයි මටයි – ගෙඩි දෙකක් ඇති
වැඩිය කඩන නරක ළමයි – එම නොවේ අපි

†3 .

ටිකිරි ටිකිරි ටිකිරි ලියා
කළෙත් අරන් ළිඳට ගියා
ළිඳ වටකර කබරගොයා
කකුල කාපි දියබරියා

†4 .

රෝස මලේ නටුවෙ කටු
වන බඹරෝ ඔහොම හිටු
නටුව නොවේ මල සිඹිමි
මම ළමයෝ පැණි උරමි

†5 .

මගෙ පොඩි තාරා - පී පී ගැවා
හොට රතු පාටයි - ඇඟ සුදු පාටයි
අර අර පේනා - සීතල වතුරේ
අත්තටු සලමින් - පීන පීන නැවා

†6 .

චුට්ටන් බට්ටිත්තා - දං ගෙඩියක් දැක්කා
චිප්පි චිප්පි ගැවා - චුටි හොටින් ඇන්නා
ඩිංග ඩිංග කැවා - බන්ඩි ගෙඩිය ආවා

†7 .

දිලී දිලී දිලී - වලා කුලෙන් එහා
සුදු අහස් කුසේ - රිදී රුවක් පෙනේ
මුළු රැයක් රැවින් - දිලෙයි දිලෙයි දිලෙයි
හිරු එනු දැකා - නුඹේ රුවත් මැකෙයි

†8 .

අතුරු මිතුරු දඹදිවතුරු - රාජ කපුරු සෙට්ටියා
වරා ගහට ගිහින් බොලන් - පුහු කරට්ය තෙලන් බොලන්
අළුත ගෙනා මනමාලී - සහල් පතක් ගරාපී
ඉහල ගෙටත් බෙදාපී - පහල ගෙටත් බෙදාපී
හතෙන් එකක් ගොඩගතියෝ - අතක් ගතින් සෙට්ටියෝ
අතුරු මිතුරු දඹදිවතුරු - රාජ කපුරු සෙට්ටියා

†9.
අහසට පිඹිනා එරන් කළේයා
පොළවට පිඹිනා හූම් කළේයා
රන් රසු දහසක් වටින කළේයා
නොබිඳින් නැතෝ මගේ කළේයා

†10.
රන් රඹුටන් ගස් දෙකයි
වළි කුකුලන් පස් දෙනයි
උන්ගෙ කරේ බොත්තමයි
බලන්න හරි ලස්සනයි

†11.
හඳ පානේ වැළිතලා – සුර කුමරියෝ මල් සලා
නටති එදෙස බල බලා – ගිගිරි වළලු පය තොලා
සුර කුමරුවෝ පෙළ සැදී – පටින් යෙතින් රඟ යෙදී
හඟව සිතාලය වැනී – වීණා වෙන නද නොදී

හඳ පානේ වැළිතලා – සුර කුමරියෝ මල් සලා
නටති එදෙස බල බලා – ගිගිරි වළලු පය තොලා
සඳුද සිතිඳු රැක් බඳු – නොහෙළා ඉම එක බඳු
වළාකුළින් පිරිසිඳු – පෙරා එවයි බිඳු බිඳු

## †12.

අර ගසේ එකයි – මේ ගසේ එකයි
පැහිල ඉදිල හරි රසයි – ඔක්කොම අඹ දෙකයි
මී අඹ ගෙඩි දෙකයි – පේර ගසේ එකයි
පේර කඩල අඹත් එක්ක – සේරම ගෙඩි තුනයි
දෙකයි දෙකයි කියනවා – ගෙඩි හතරක් කඩනවා
දෙකයි දෙකයි එක් උනාම – ගෙඩි හතරක් තියෙනවා

## †13.

කපුටු කාක් කාක් කාක් – ගොරක දේන් දේන් දේන්
දොරකඩ වැලේ බුලත් බුලත් – බට පඳුරේ පුවක් පුවක්
කපුටු කාක් කාක් කාක් – ගොරක දේන් දේන් දේන්
කපුටිගෙ කටේ වැල මදුලයි – කපුටාගෙ කටේ රන් මුද්දයි
කපුටාගෙ කටේ රයිගම් යන්නට – උසි කපුටෝ උසී

## †14.

හඳ හාමී හැංගි හැංගි එබිල බලනවා
ඈත අහසෙ වටකුරුවට සුදට පේනවා
රන් තැටියට කිරියි පැණියි අරගෙන එනවා
පුංචි අපිට ඉන් ටික ටික දීලා යනවා

## †15.

අද පලවෙනිදා මාසයෙ මුල් දවස අදයි
අද පලවෙනිදා හෙට ලබන්නෙ හෙට ලබන්නෙ
දෙවෙනි දවස දෙවෙනි දවස
ඒක දෙවෙනිදා ඒක දෙවෙනිදා //

තුන් වෙනිදා සිව් වෙනිදා – පස් වෙනිදා හය වෙනිදා
ඊට පස්සෙ හත් වෙනිදා – එක සතියක් ගෙවෙනවා
හත් වෙනි දවසට පස්සේ – අට වෙනිදා නම වෙනිදා
ඊට පස්සෙ ?
ඊට පස්සෙ උදාවෙන්නෙ – දහ වෙනි දවසයි
දහ වෙනි දවසයි / / / / / / / / /

## †16.

කෙළි පැටවුන් තුන් දෙනයි – කොළු පැටවුන් පස් දෙනයි
පුංචි පැංචි ටිකිරි පැටවු – සෙල්ලම් ගෙයි අට දෙනයි

හා පැටවුන් තුන් දෙනයි – බළු පැටවුන් හය දෙනයි
සෙල්ලම් බඩු ගනන් කරල – දැන් සේරම නව දෙනයි

වැලි බත් මුල් පත් තුනයි – කෝම් පිට්ටු ගෙඩි හතයි
හතයි තුනයි එකතු කරමු – දැන් දහයයි හරි හැඩයි

## †17.

මල් පිපිලා මල් පිපිලා
ඉහල අත්තෙ මල් පිපිලා – එකයි දෙකයි තුනයි
පහල අත්තෙ මල් පිපිලා – හතරයි පහයි හයයි
ගහ මුදුනෙත් මල් පිපිලා – හතයි අටයි නවයයි
නව තියෙනව නව තියෙනව – අර බලන්න දහයයි
ඉහල අත්තෙ පහල අත්තෙ ගහ මුදුනේ මල් ගොඩයි
ගනන් කරමු ගනන් කරමු මල් කීයද දැන්
එකයි දෙකයි තුනයි හතරයි පහයි හයයි
හතයි අටයි නවයයි දහයයි